# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1992 අංක 28 දරන
## සදහම් මිතුරු සමුළුව
## (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අප්‍රේල් මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 28 දරන සදහම් මිතුරු සමුළුව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අප්‍රේල් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 95/90

**සදහම් මිතුරු සමුළුව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සදහම් මිතුරු සමුළුව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන බෞද්ධ පරම විඥානාර්ථ සම්ප්‍රදායට අයත් සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියළු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා 1958 සිට මහනුවර පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, එකී පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 28 දරන සදහම් මිතුරු සමුළුව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු 'සමිතිය' යනුවෙන් සඳහන් කරනු ලබන) සදහම් මිතුරු සමුළුවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයින් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භවන දිනයෙහි සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සදහම් මිතුරු සමුළුව" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්විය යුතු ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමටත්, පාවිච්චි කිරීමටත් කැමති පරිදි එය වෙනස් කිරීමටත් පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. සදහම් මිතුරු සමුළුව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවීම අරමුණුකොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බුදුන් වහන්සේ දේශනා කළ උත්තරීතර ඵලය අවබෝධ කොට ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශය ගිහි ශ්‍රාවකයනට ලබාදීම;

(ආ) ගිහි ශ්‍රාවකයන් අතර කල්‍යාණ මිත්‍ර සම්බන්ධතා ඇති කිරීම;

(ඇ) ධර්මිෂ්ඨ සමාජයක් ගොඩනැංවීමට උපකාර කිරීම;

(ඈ) 'පරියත්ති, පටිපත්ති සහ පටිවේධ' යන අංශ යටතේ බුදු දහම පිළිබඳ අධ්‍යයන කටයුතුවල යෙදීමට අනුබල දීම;

(ඉ) අධ්‍යාත්මික මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම ; හා

(ඊ) ඉහත කී පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

විධායක කමිටුව.

4. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තාවූ ද, ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කරනු ලබන්නාවූ ද, පහත සඳහන් අයගෙන් සමන්විත විධායක කමිටුවක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතුය :—

(අ) සභාපති ;

(ආ) උපසභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ සංවිධායක වරයෙක් ; සහ

(ඇ) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තාවූ ද, ඒ රීති වලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ ද වෙනත් සාමාජික සංඛ්‍යාවක්.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී ධුර දැරූ සමිතියේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද විධායක කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා යම් රීතියක් එවැනිම රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් සහ එවැනිම ආකාරයෙන් මිස, වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ හැකි ය :

එසේ වුව ද, සංස්ථාවේ ප්‍රධාන ගිහි අනුශාසක විසින් අනුමත කරනු ලැබුවහොත් මිස, එවැනි වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සංශෝධනයක් හෝ පරිච්ඡින්න කිරීමක් බල නොපැවැත්විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතියේ පැවැති රීති, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස බලපැවැත්විය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබූ යම් නිශ්චල හෝ චංචල දේපළක් භාරගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර එවැනි සියළු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

7. (1) මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුතු කිරීම හා අස්කිරීම ඇතුලුව සංස්ථාවේ සියළුම පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන් පත් කර ගැනීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියා සහ දේවල් කිරීමට සහ ඉටු කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

(2) සංස්ථාව වෙත 6 වෙනි වගන්තිය සහ මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවරනු ලැබූ බලය, විධායක කමිටුව විසින් සංස්ථාවේ ප්‍රධාන හිමි අනුශාසකගේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කළ යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු ණය සහ සමිතියට අයවිය යුතු ණය.

8. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී සමිතියේ පැවති සියළුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සමිතියට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියළු ණය මුදල්, දායක මුදල් සහ සහභාගි මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයින් දෙදෙනා පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මඟින් හා ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.